රුහුණ විශ්වවිද්‍යාලය

**2016/2017 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 4000 ස්ථලය**
**දෙවන සමාසික පරීක්ෂණය - 2018 මැයි (පැරණි නිර්දේශය)**

**GEO 4202 – දක්ෂිණ ශ්‍රී ලංකාවේ භූගෝලීය පැතිකඩ**

**<u>ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.</u>**

**කාලය : පැය 03 යි.**

---

01. "දක්ෂිණ ශ්‍රී ලංකාව බහුවිධ නග්නීකාරක ක්‍රියාවලි ඇසුරින් හඳුනාගත හැකි භූ රූප ලක්ෂණ වලින් සංයුක්ත කලාපයකි." මෙම ප්‍රකාශය අදාළ රූපසටහන් සහ නිදසුන් ඇසුරින් විභාග කරන්න.

(ලකුණු 20)

02. දක්ෂිණ ශ්‍රී ලංකාවේ භූ විද්‍යාත්මක පැතිකඩ ශ්‍රී ලංකාවේ අවසන් භූ විද්‍යාත්මක යුගයේ කාල පරිච්ඡේදයට අදාළව විග්‍රහ කිරීම කෙතෙක් දුරට සාධාරණ ද? විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 20)

03. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන වෙරළ සම්පත් කෙටියෙන් හඳුන්වා, මෑත කාලීනව දක්ෂිණ ශ්‍රී ලංකාවේ එම සම්පත් ආශ්‍රිතව මතු වී තිබෙන ගැටලු මොනවා ද යන්න සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

04. ශ්‍රී ලංකාවේ අර්ථ ක්‍රමය තුළ කෘෂිකර්මාන්තයට වැදගත් තැනක් හිමි වේ. එහෙත් මෑත කාලීනව දක්ෂිණ ශ්‍රී ලංකා කලාපය තුළ කෘෂිකර්මාන්තය ආශ්‍රිතව බොහෝ ගැටලු විවිධ පැති ඔස්සේ උද්ගතව පවතී. විග්‍රහ කරන්න.

(ලකුණු 20)

05. "පාරිසරික සංචරණය සඳහා දක්ෂිණ ශ්‍රී ලංකාව සුවිශේෂී කලාපයකි." උචිත නිදසුන් දක්වමින් විමසන්න.

(ලකුණු 20)

06. දක්ෂිණ ශ්‍රී ලංකාවේ මානව සම්පත මුහුණදෙන ගැටලු හා අභියෝග උචිත දත්ත ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

07. දක්ෂිණ ශ්‍රී ලංකාවේ සංස්කෘතික ගතිකත්වය හා ඒ ආශ්‍රිත සුවිශේෂී ලක්ෂණ නිදසුන් සහිතව විමර්ශනය කරන්න.

(ලකුණු 20)

@@@@@@@@@@@@@@@@@@@